Abstract No: HSS 40 Humanities, and Social Sciences

# සිංහල වන්දනා කාව්‍යයන්හි විද්‍යමාන භාෂා ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් කෘති ඇසුරෙන්)

එන්. එම්. පතිරණ[1*]

[1]සිංහල අධ්‍යයනාංශය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පද්‍ය සාහිත්‍යයෙහි උපශානරයක් වශයෙන් සිංහල වන්දනා කාව්‍ය වෙසෙස් වෙයි. මහින්දාගමනයත් සමග ලාංකේය සමාජයෙහි ඇති වුණු බෞද්ධාගමික ප්‍රබෝධය හේතුවෙන් රජවරුන් විසින් අනුගමනය කරන ලද විශාල පුණ්‍යකර්මයක් වූයේ සිද්ධස්ථාන වන්දනා කිරීමට යාමයි. එහි යනෙන අතරතුර දුෂ්කර ගමනෙහි විඩාව සංසිඳුවා ගැනීමට කවි කීම ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පශ්චාත්කාලීන ව වන්දනා කාව්‍ය නමැති සාහිත්‍යාංගය බිහි වූ අතර මධ්‍යකාලීන අවධිය වන විට වන්දනා කාව්‍ය රචනා කිරීම වර්ධනය විය. සිංහල වන්දනා කාව්‍යයන්හි සාර්ථකත්වයට හේතු වී ඇති භාෂා ලක්ෂණ කවරේ ද? යන්න පර්යේෂණ ගැටලුවයි. සිංහල වන්දනා කාව්‍යයන්හි විද්‍යමාන වන භාෂා ලක්ෂණ පිළිබඳ ව අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණයි. මෙහි පර්යේෂණ සීමාව වන්නේ ශ්‍රී පාදස්ථානය විෂය කොට ලියැවුණු වන්දනා කාව්‍ය වන *ශ්‍රීපාදපත්මය වන්දනා ගාථා සහ අභිනව හිමගත වර්ණනාව, පුරාණ සමනල හැල්ල* කෘති ද්විත්වයේ භාෂා ලක්ෂණ පමණක් අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණය *ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය* යටතේ පුස්තකාලය සහ අන්තර්ජාලය භාවිතයෙන් සපයා ගන්නා ලද ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය දත්ත ආශ්‍රයෙන් සිදු කරන ලදී. කාව්‍ය නිර්මාණකරුවාගේ ප්‍රධාන මෙවලම වනාහි භාෂාවයි. කිසියම් කෘතියක භාෂා ලක්ෂණ එම කෘතියෙහි අගය තීව්‍ර කිරීම උදෙසා හේතු වේ. ශ්‍රී පාදස්ථානය වස්තු විෂය කරගෙන ජන කාව්‍ය ශෛලියෙන් ලියැවුණු මෙම වන්දනා කාව්‍ය කෘති ද්විත්වයේ ම සරල ප්‍රකාශන රීතිය සහ ගැමි බස් වහර, දේශීය උපමා රූපක යෝජනය, එළිසමය ආරක්ෂා කිරීම, අනුප්‍රාස ජනනය, රිද්මානුකූල භාෂා විලාසය නිරූපණය වේ. එසේ ම සංක්ෂිප්ත භාෂා ශෛලිය, සම්භාව්‍ය සාහිත්‍යයේ දී දෝෂයක් ලෙස සැලකූ පුනරුක්තය උපක්‍රමශීලී ව භාවිතය, *ශ්‍රීපාදපත්මය වන්දනා ගාථා සහ අභිනව හිමගත වර්ණනාව* කෘතියෙහි සංස්කෘත හා පාලි ආභාසය මෙම කෘතිවල අන්තර්ගත වී ඇති භාෂා ලක්ෂණ වශයෙන් හඳුනා ගත හැකි ය. එබැවින් සිංහල වන්දනා කාව්‍ය නිර්මාණකරුවා මෙවැනි භාෂා ලක්ෂණ අනුගමනය කිරීමට පෙලඹීම හේතුවෙන් ජන කාව්‍ය නිර්මාණකරුවෙකු වුවත්, උපක්‍රමශීලී ව භාෂාව හැසිරවීමෙහි ලා ඔහු සතු නිසර්ග ප්‍රතිභාව විශද කරවන අතර එය කෘතියේ රසය තීව්‍ර කරමින් සාර්ථක නිර්මාණයක් බිහි කිරීමට ඉවහල් වී ඇති වැදගත් ව්‍යූහාත්මක අංගයක් බවට පත් වී ඇති බවත් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** භාෂා ලක්ෂණ, මධ්‍යකාලීන අවධිය, මහින්දාගමනය, ශ්‍රී පාදස්ථානය, සිංහල වන්දනා කාව්‍ය

* nimeshikamalshani1997@gmail.com